# සංවර්ධන ව්‍යාපෘති මානව අයිතිවාසිකම් කෙරෙහි බලපාන ආකාරය: උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඇසුරින්

එන්. එම්. එම්. දිල්රුක්ෂ[14],

## සංක්ෂේපය

ශ්‍රී ලංකාව තුළ ද, සංවර්ධන ව්‍යාපෘතීන් බහුලව සිදුවන අතර මෑත කාලීනව විශාල වශයෙන් කතා බහට ලක් වූ සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස උමා ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය අවධානයට ලක්වේ. උමා ඔය ව්‍යාපෘතිය හේතු කොටගෙන බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විවිධ ගැටලු සහගත තත්ත්වයකට මුහුණ දී තිබෙන බව එදිනෙදා මාධ්‍ය හරහා විවිධාකාරයට සාකච්ඡාවට ලක් විය. එබැවින් උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජන ජීවිතයට සිදු වී ඇති බලපෑම කෙසේ ද පිළිබඳව සහ එමඟින් මිනිස් අයිතිවාසිකම්වලට සිදුවන බලපෑම පිළිබඳව සොයා බැලීම මෙමඟින් අධ්‍යයනය කරනු ලැබිණ. මෙම ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතික දත්ත උපයෝගී කරගනු ලැබීය. ප්‍රාථමික දත්ත මෙම ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචිකර ඇති මොරගොල්ල ගම්මානය හා කැටකැල්ල, මිරහවත්ත ප්‍රදේශයේ ජනතාවගෙන් අහඹු ලෙස තෝරා ගත් පවුල් 100ක් සඳහා ප්‍රශ්නාවලියක් ලබාදෙමින් හා ජනතාව සමඟ සිදුකරන ලද සාකච්ඡාවන් තුළින් රැස් කෙරිණි. ද්විතික දත්ත වශයෙන් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත්වූ වාර්තා, පුවත්පත් වාර්තා, පර්යේෂණ වාර්තා, පොත්පත් මෙන් ම, අන්තර්ජාලයෙන් ලබා ගත් දත්ත උපයෝගීකර ගන්නා ලදි. ප්‍රාථමික හා ද්විතික දත්ත යටතේ ලබා ගන්නා ලද දත්ත අතරින් ප්‍රාථමික දත්ත spss මෘදුකාංගය භාවිතයෙන් ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් හරහා ද, ද්විතික දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කරන ලදි. එම දත්ත ඉදිරිපත් කිරිමේදී වගු ප්‍රස්ථාර උපයෝගිකර ගනු ලැබිණි. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුළින් ජන ජීවිතයට අහිතකර බලපෑමක් වී ඇති බව පැහැදිළිව හඳුනාගත හැකි විය. එනම් ජනතාවගේ ජීවත් වීමේ අයිතියටත් කැමති තැනක පදිංචිවීමට ඇති අයිතියටත් පානීය ජලය පිළිබඳ ගැටලුවකටත් රැකියා අහිමි වීමටත් දේපළ සඳහා වන අයිතියටත් යටිතල පහසුකම් සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයකටත් මුහුණ දී ඇති බව අනාවරණය කරගැනීමට හැකි විය.

**මුඛ්‍යපද:** *උමාඔය, සංවර්ධන ව්‍යාපෘති , අයිතිවාසිකම්, ගැටලුව*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර එම සංවර්ධන ව්‍යාපෘති මඟින් ඇතැම් විට මිනිස් අයිතිවාසිම් කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබයි. එබැවින් මෙම ලිපිය ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේ, එලෙස ක්‍රියාත්මක කළ උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව මිනිස් අයිතිවාසිකම් කෙරෙහි සිදු වී ඇති බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමය. එහිදී ප්‍රථමව උමා ඔය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාවේ ආරම්භ වීමේ පසුබිම හඳුනා ගැනීම වැදගත්ය. 2008 වර්ෂයේ දී මහින්ද රාජපක්ෂ මහතා සහ ඉරාන රජය විසින් අත්සන් තබන ලද ද්වි පාර්ශවික ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක ණය ආධාර යටතේ උමා ඔය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදි. වොට් 231ක විද්‍යුත් ශක්තියක් උත්පාදනය, වගා කළ හැකි බිම් හෙක්ටයාර් 4500ක් දක්වා පුළුල් කිරීම, උමා ඔයේ ජලයෙන් වැව් 14ක් පිරවීම වැනි පරමාර්ථ මූදුන් පමුණුවා ගැනීමේ අරමුණින් ඇරඹි මෙම බහුකාර්ය යෝජන ක්‍රමය හේතුකොටගෙන අද වන විට ශ්‍රී ලංකාවේ මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගැටළු පැන නැඟී ඇත. මෙයින් ප්‍රධාන වශයෙන්ම, වෙහෙරගල තැන්න, මකුල්

[14] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යාව (විශේෂවේදි), තෙවන වසර


ඇල්ල, එගොඩගම ඇතුළු ප්‍රදේශයන්හි ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අභියෝග එල්ල වී ඇත. විශේෂයෙන් ම, බණ්ඩාරවෙල ප්‍රදේශයේ ගම්මාන රැසකම ළිං 120ක් පමණ සම්පූර්ණයෙන් සිඳී යාමට ලක්ව ඇත. එමෙන් ම, තවත් ළිං 150ක පමණ ජලය හිඳෙන තත්ත්වයට පත් ව ඇත. තව ද, ජනතාවගේ පානීය ජල සපයා ගැනීම සම්බන්ධයෙන්, ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් ප්‍රහල ප්‍රහාරයක් මෙමඟින් එල්ල වී ඇත. එසේම, උමා ඔය බහු කාර්ය ව්‍යාපෘතිය හේතුවෙන් පිරිසක් අවතැන්භාවයට මේ වන විට පත්ව ඇත (www.wikalpa.lk). සැබවින්ම මෙවන් පසුබිමක් මත උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වන ජනතාවගේ ආකල්ප පිළිබඳවත්, ව්‍යාපෘතිය හේතුවෙන් සමස්ථයක් ලෙස ජන ජීවිතයට සිදු වී ඇති බලපෑම් පිළිබඳවත්, ඒවා ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි ඇති කර තිබෙන බලපෑම පිළිබඳවත් අධ්‍යයනය කිරීම වැදගත්ය.

## උමා ඔය ව්‍යාපෘතිය යටතේ මිනිස් අයිතිවාසිම්වලට සිදු වූ බලපෑම.

### උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගේ ආකල්ප.

උමා ඔය ව්‍යාපෘතිය ඇසුරින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් මිනිස් අයිතිවාසිකම්වලට සිදුවන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සිදුකරන මෙම සමීක්ෂණයේ දී ප්‍රතිචාරින් විසින් උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දරන ආකල්පය පිළිබඳව මෙහිදි අවධානය යොමු කරනු ලැබේ. ප්‍රතිචාරින් විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දක් වූ ආකල්පය කුමක් ද යන්න පහත ප්‍රස්ථාරය මඟින් පැහැදිලිව හඳුනාගත හැකිය.

ප්‍රස්තාර 1ඃ උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගේ ආකල්පය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

මෙම 1 ප්‍රස්ථාරයට අනුව පැහැදිලි වන්නේ සමස්ථ නියදියෙන් වැඩිම පිරිසකගේ ආකල්පය වී තිබෙන්නේ උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සෘණාත්මක ආකල්පයක් බවයි. උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගෙන් 47 දෙනෙකු මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අසතුටුදායක බව ප්‍රකාශ කර තිබෙන අතර ඉතා අසතුටුදායක යැයි ප්‍රතිචාරින්ගෙන් 21 දෙනෙකුගේ මතය වී තිබේ. ඒ අනුව එය සමස්ථ නියදියෙන් 68%ක ප්‍රතිශතයක් වේ. ක්ෂේත්‍ර සමීක්ෂණය මඟින් දත්ත රැස් කිරීමේ දී කැටකැල්ල ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලද පිරිසෙන් එක් කාන්තාවක් ප්‍රකාශකර සිටියේ "උමා ඔයේ ගලන වතුරට වඩා ඇයගේ ඇස්වලින් ගලන කඳුළු වැඩි බවයි". එවැනි සංවේදී වදන් මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ ජනතාවගේන් අසන්නට ලැබීම මඟින් ජනතාව මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් එතරම් කැමැත්තක් නොපවතින බව සනාථ වේ. ව්‍යාපෘතිය පිළිබඳව සතුටුදායක ආකල්පයක් පවතින බවට දක්වා තිබෙන්නේ ප්‍රතිචාරින්ගෙන් 7%ක පමණ සුළු ප්‍රතිශතයකි. ඊට අමතරව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගෙන් 25%ක ප්‍රමාණයක් මධ්‍යස්ථ


මතයක් දරන බව මෙමගින් පැහැදිලි වේ. මධ්‍යස්ථ මතයක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රතිචාරින්ගෙන් බහුතරයක් ප්‍රකාශකර සිටියේ "කියන්න තරම් හොඳක්වත් නරකක්වත් නෑ". හොඳ නරක දෙකම විඳදරාගෙන සිටින බවයි.

ප්‍රතිචාරින් විසින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කර තිබෙන ආකල්ප අනුව පැහැදිලි වන්නේ මෙම ව්‍යාපෘතිය හේතුවෙන් මිනිස් අයිතිවාසිකම්වලට හිතකර බලපෑමක් මෙන් ම අහිතකර බලපෑමක් ද, සිදුවී තිබෙන බවයි. එය පහත සඳහන් විශ්ලේෂණයන් තුළින් පැහැදිලිව පෙන්වා දිය හැකිය.

## උමා ඔය ව්‍යාපෘතිය ප්‍රතිචාරින්ගේ ජන ජීවිතයට බලපා ඇති ආකාරය.

උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රතිචාරින්ගේ ආකල්පය විමසීමේ දී බහුතර ප්‍රතිචාරින් පිරිසකගේ ආකල්පය වුයේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තමන් අසතුටුදායක බවයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රතිචාරින්ගේ ජන ජීවිතයට කුමන ආකාරයේ බලපෑමක් සිදුකර තිබේ ද යන්න විමසූ විට ප්‍රතිචාරින්ගෙන් බහුතරයකගේ මතය වුයේ මෙමගින් අහිතකර බලපෑමක් ජනජීවිතයට සිදු වී තිබෙන බවයි. පහත ප්‍රස්තාරය මගින් එය පෙන්වාදිය හැකිය.

ප්‍රස්තාර 1ඃ උමා ඔය ව්‍යාපෘතිය මගින් ජන ජීවිතයට සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

මෙම ප්‍රස්තාරයට අනුව ප්‍රතිචාරින්ගෙන් 61% ක ප්‍රතිශතයක් ප්‍රකාශ කර තිබෙන්නේ ජන ජීවිතයට උමා ඔය ව්‍යාපෘතිය මගින් අහිතකර බලපෑමක් ඇති වී ඇති බවයි. 35% ක ප්‍රතිශතයක් මේ පිළිබඳව මධ්‍යස්ථ මතවාදයක් ඉදිරිපත්කර තිබේ. බලපෑමක් නොමැති බවට අදහස් ඉදිරිපත්කර තිබෙන්නේ 4%ක ප්‍රතිශතයකි. ප්‍රතිචාරින්ගේ ජන ජීවිතයට උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් අහිතකර බලපෑමක් සිදු වී ඇති බව පැහැදිලි වේ. ඒ අනුව ව්‍යාපෘතිය මගින් ප්‍රතිචාරින්ට අහිමි වීම් සිදු වීම්, යටිතල පහසුකම්වලට වන බලපෑම, පාරිසරික, සමාජීය වශයෙන් සිදු වන බලපෑමත් එමගින් අයිතිවාසිකම්වලට සිදුවන බලපෑමත් පහත විශ්ලේෂණයන් මගින් හඳුනාගත හැකිය.

## උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ට අහිමි වීම් සිදු වී ඇති ආකාරය.

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ධනාත්මක හා ඍණාත්මක බලපෑම් විවිධාකාරයෙන් සිදු වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඊට අදාළ ප්‍රදේශයෙන් ජනතාව ඉවත් කිරීම් සිදු කරයි. එසේ ජනතාව තමන්ගේ වාසස්ථාන වලින් ඉවත් කිරීමේ දී ජනතාවට දේපළ හානියක් හෝ දෙපළ අහිමි වීමක් සිදු වේ. එය ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි සිදුවන අහිතකර බලපෑමකි. උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ට අහිමි වීම් සිදු වී තිබෙන්නේ පහත සඳහන් පරිදිය.

වගු අංක 1ඃ උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති අහිමිවීම්වල ස්වභාවය.

| අනු අංකය | අහිමි වීම්වල ස්වභාවය | ප්‍රතිචාරින් ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | ණිවාස | 100 | 100% |
| 2 | ඊඩම් | 100 | 100% |
| 3 | වගා බිම් | 73 | 73% |
| 4 | වෙළඳ සැල් | 9 | 9% |
| 5 | වෙනත් | 0 | 0% |

මූලාශ්‍රය ඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

වගුවට අනුව පැහැදිලි වන්නේ ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති අහිමි වීම්වල ස්වභාවයවන අතර එහිදි ප්‍රතිචාරින් සියලු දෙනාගේම නිවාස හා ඉඩම් ව්‍යාපෘතිය හේතුවෙන් අහිමි වී තිබේ. වගා බිම් අහිමි වීමේ ප්‍රතිශතය 73% කි. එසේම වෙළඳ සැල් අහිමි විමේ ප්‍රතිශතය 9% කි. මෙමඟින් පෙනි යන්නේ මිනිසාට තමන් කැමති ස්ථානයක පදිංචි වීමත් දේපළ සඳහා වන අයිතිවාසිකම්වලටත් අහිතකර බලපෑමක් හෙවත් මෙමගින් එකි අයිතිවාසිකම් උල්ලංඝනය වීමත් සිදු වී ඇති බවයි. සංවර්ධන ව්‍යාපෘති මඟින් අවතැන්වන ජනතාව නැවත පදිංචි කරනු ලබන අතර අහිමිවන දේපළ වෙනුවෙන් වන්දි ගෙවිම සඳහා රජය කටයුතු කරනු ලබයි. උමා ඔය ව්‍යාපාතිය යටතේ ද, මෙම වන්දි ගෙවීමේ කාර්ය සිදු කර තිබේ. එසේ වුවත් ජනතාව මැසිවිලි නගනුයේ වන්දි මුදල් ප්‍රමාණවත් පරිදි ලැබි නොමැති බව පවසමිණි. ප්‍රතිචාරින් තමන් හට සිදු වු අහිමි වීම් වෙනුවෙන් ලබා දුන් වන්දි මුදල් සම්බන්ධයෙන් දක්වන අදහස් අනුව ඒ බව මනාව පැහැදිලි වේ.

වගු අංක 2ඃ අහිමිවීම්වලට වන්දි ලැබීම පිළිබඳ ප්‍රතිචාරින්ගේ ආකල්පය.

| අහිමි වීම්වල ස්වභාවය | වන්දි ලැබීම | | අහිමි වු දෑ වෙනත් ස්ථානයකින් ලැබීම |
|---|---|---|---|
| | ප්‍රමාණවත් | ප්‍රමාණවත් නෙවේ | |
| නිවාස | 4 | 96 | - |
| ඉඩම් | | 100 | හිමි විය |
| වගා බිම් | | - | - |
| වෙළඳ සැල් | | 11 | - |
| වෙනත් | - | - | - |

මූලාශ්‍රය ඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

මෙම වගු සටහනට අනුව පෙනී යන්නේ අහිමි වීම් සඳහා වන්දි ලැබීම ප්‍රමාණවත් නොවන බව බහුතරයකගේ මතවාදය වී තිබෙන බවයි. නිවාස සඳහා වන්දි තක්සේරු කිරීමේ දී ප්‍රතිචාරින්ලෙන් 4% ප්‍රමාණයක් වන්දි මුදල් ප්‍රමාණවත් බව පැවසුව ද 96% ක ප්‍රතිශතයක් පවසා ඇත්තේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවන බවයි. ඉඩම් අහිමි වීම් සම්බන්ධයෙන් විමසිමේ දී පෙනී යන්නේ ඉඩමට ලැබුණු වන්දි ප්‍රමාණවත් නොවන බව සියලු ප්‍රතිචාරින්ගේ අදහස වන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව, ඉඩමට ඉඩමක් බෝනස් එකක් ලෙස ලබා දී ඉඩමට තක්සේරු කරන ලද වන්දි මුදලක් ද, මෙම ජනතාවට ලබා දී ඇති බවයි.


එහිදි ප්‍රතිචාරින්ගෙන් බහුතරයක් තමන්ට වන්දි ලැබීම් ප්‍රමාණවත් නොවු බව ප්‍රකාශ කළ ද, හිමිකම් ඔප්පු තිබු ප්‍රතිචාරින්ගෙන් බහුතරයකට නිසි තක්සේරුගත වන්දි ලැබුණු පවා ප්‍රකාශ කරන ලදි. පරම්පරාගතව පැවතිය ද, ඇතැම් ඉඩම් සඳහා නිසි තක්සේරුවක් ලැබි නොමැති බව මෙම අධ්‍යනයේ දී පැහැදිලි විය. ඊට අමතරව වගා බිම් සඳහා අඩු තක්සේරු කිරීමකට ලක් වී ඇති අතරම අක්කර දෙකක උපරිමයකින් හඳපානාගල ප්‍රදේශයෙන් ලබා දීමට කටයුතු යොදා ඇති බවත් මේ වන විටත් ඉඩම් මැනීමේ කටයුතු සිදු වන බවත් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උමා

ඔය ව්‍යාපෘති අංශයේ නිලධාරිනියක් විසින් ප්‍රකාශ කර සිටියේය. දේපළ හිමිකම පිළිබඳව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් දක්වා තිබුනා වුවත් මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවගේ එම අයිතිය සීමා වීමක් සේම උල්ලංඝණය වීමක් සිදු වන බව පැහැදිලි වේ.

**උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ගේ රැකියාවට සිදු වී ඇති බලපෑම.**

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි සිදු වී ඇති බලපෑම පිළිබඳව විමසා බැලීමේ දී මෙම ප්‍රදේශයේ බහුතරයක් පිරිස ජීවිකාව වශයෙන් සිදු කරනු ලබන්නේ කෘෂිකර්මතය ආශ්‍රිතවය. මෙම සමීක්ෂණය මඟින් පැහැදිලි වන්නේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව රැකියාවේ නිරත වු ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි මෙම ව්‍යාපෘතිය මඟින් අහිතකර බලපෑමක් සිදු වී ඇති බවයි. ප්‍රතිචාරින් විසින් රැකියාවට සිදු වී ඇති බලපෑම සම්බන්ධයෙන් දක්වු අදහස් පහත පරිදි පෙන්වා දිය හැකිය.

ප්‍රස්තාර අංක 2ඃ රැකියාව සම්බන්ධයෙන් ප්‍රතිචාරින් දක්වු ආකල්පය.





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

රැකියාව සම්බන්ධයෙන් ඇති බලපෑම පිළිබඳව ප්‍රතිචාරින් ප්‍රකාශකර ඇති ආකාරය දෙස බැලීමේ දී 41% ක ප්‍රතිශතයක් රැකියාවට ඉතා ප්‍රබල බලපෑමක් සිදු වී ඇති බව දක්වා තිබේ. 34% ක ප්‍රතිශතයක් ප්‍රබල බලපෑමක් සිදු වී ඇති බව දක්වා ඇත. කුඹුරු ඉඩම් අහිමි වීම හේතුවෙන් ජනතාවගේ ජීවනෝපාය මාර්ග අහිමි වී තිබේ. මෙහිදි රැකියාවට සිදු වී ඇති බලපෑම කෙසේදැයි පැවසු විට එක් ප්‍රතිචාරියෙකු විසින් ප්‍රකාශ කරනු ලැබුවේ "අපි හිටියේ ගඟ ළඟමයි. ගෙදරට පහළින් ගඟ අයිනේ අපි කංකුං වගාව කරා අතුරු ආදායමක් විදිහට. එකෙන් අපි මාසෙකට රුපියල් 18,000 ක් පමණ හම්බ වුණා. දැන් අපිට ඒ කිසි දෙයක් නෑ. දැන් අපිට ණයට මුදල් අරගෙන්නත් වෙලා. ඊට කලිනි අපිට ණය වෙන්න වුනේ නෑ. ඉතින් අපිට මේ ව්‍යාපෘතියෙන් වෙච්ච හොඳක් නෑ. යන එන මං නැති වුණා මිසක්" යනුවෙනි. මෙවැනි අදහස් බොහෝමයක් ප්‍රතිචාරින්ගෙන් අසන්නට ලැබිණි. වගා බිම් අහිමි වීම හේතුවෙන් විශාල පිරිසක් රැකියා අහිමි වීමෙන් දුෂ්කරතාවයට පත් වී තිබේ. වර්තමානය වන විට ප්‍රතිචාරින්ගෙන් බහුතර පිරිසකට රැකියාව අහිමි වී තිබේ. කුඹුරු ඉඩම් ලබා දෙන බව පැවසුව ද මෙතෙක් හිමි නොවිම මෙයට මුලිකම හේතු සාධකය වී තිබේ.

රැකියාව සඳහා කිසිසේද බලපෑමක් වී නොමැති බවට ප්‍රතිචාරින්ගෙන් 6 දෙනෙකු දක්වා තිබේ. ඔවුන් සියලු දෙනාම රජයේ රැකියාවක නිරතවන පුද්ගලයන් විය. ගොවිතැන හා සම්බන්ධ කටයුතු හේතුවෙන් මෙන් රැකියාවට බලපෑමක් සිදු වී නොමැති බව ප්‍රකාශ කර තිබේ. මධ්‍යස්ථ බලපෑමක් ඇති බව ප්‍රකාශකර තිබෙන්නේ 14% ක ප්‍රතිශතයකි. එතරම් බලපෑමක් නොමැති බව 6% ක ප්‍රතිශතයක් ප්‍රකාශ කර තිබේ. වෙළදාම් කටයුතු සිදුකරන ලද ජනතාව ද තරමක් බලපෑමට ලක් වී තිබේ.

ඊට අමතරව වර්තමානය වනවිට කිහිප දෙනෙකු රියදුරු සේවයට යොමු වී තිබෙන බවත් එයින් ද සහිමකට පත්වීමට ඔවුන්ට නොහැකි බව දක්වයි. ඒ සඳහා හේතුව වී ඇත්තේ එම රැකියාව සතියකට දෙවරක් පමණ ලැබෙන ගකියාවක් වීමයි. මෙමගින් පැහැදිලි වන්නේ එකලාව හෝ අන් අය සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමට අයිතිය පවති (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, 1978) යනුවෙන් දක්වා තිබුණ ද මෙම සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවගේ එකී අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි. රැකියාවට සිදුවන බලපෑම ජනතාවගේ ආදායම් තත්ත්වයට ද බලපෑමක් ඇති කරනු ලබයි. ප්‍රතිචාරින් විසින් ඔවුන්ගේ ආදායමට සිදු වී ඇති බලපෑම පිළිබඳව දක් වු ආකල්ප 4.3. ප්‍රස්තාරය මඟින් හඳුනාගත හැකිය.

ප්‍රස්තාර අංක 3ඃ  උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ගේ ආදායමට සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016


මෙම ප්‍රස්තාරය අනුව උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ගේ ආදායම් තත්ත්වයට සිදු වී ඇති බලපෑම හඳුනා ගත හැකිය. එහිදි ප්‍රතිචාරින්ගෙන් 35% ප්‍රතිශතයක් මෙමඟින් ආදායමට ඉතා ප්‍රබල බලපෑමක් ඇති බවට අදහස් ඉදිරිපත් කර ඇති අතර සමස්ථයක් ලෙස බලපෑමක් නොමැති බවට 7% ක ප්‍රතිචාරින් ප්‍රමාණයක් ප්‍රකාශකර ඇත. මධ්‍යස්ථ අදහසක් ඉදිරිපත් කර ඇති ප්‍රතිචාරින්ගේ ප්‍රමාණය 28 කි. එය සමස්ථ නියදියෙන් 28% ප්‍රතිශතයකි. ප්‍රතිචාරින්ගෙන් බහුතර ප්‍රමාණයක් ප්‍රකාශ කරනුයේ ඔවුන්ගේ ආදායම් තත්ත්වය පහළ මට්ටමකට පත් වී තිබෙන්නේ වගාවන් කිරීමට නොහැකි බැවින් ජීවන වෘත්තිය බිඳ වැටීම හේතුවෙන් බවයි. අද වනවිට දෛනික පරිභෝජනය සඳහා එළවලු, පළතුරු, පළා වර්ග සපයා ගැනීමට සිදු වී තිබෙන්නේ වෙළඳ පොළෙනි. එසේ වුවත් ඔවුන් මුල් පදිංචියේ දී එවැනි දෑ සපයාගෙන ඇත්තේ ගෙවත්තෙන් හෝ වගා බිම් තුළිනි.  ප්‍රතිචාරින්ගෙන් අදහස් විමසීමේ දී එක් කාන්තාවක් ප්‍රකාශ කර සිටියේ කවදාවත් “අපි පොළොස් සල්ලිවලට ගත්තේ නෑ. ඒත් දැන් අපි පොළොස් ගෙඩියක් කන්නෙත් පොළෙන් ගෙනල්ලා” එවැනි තත්ත්වයක් තුළ ප්‍රතිචාරින්ගේ ආදායමට විශාල බලපෑමක් සිදු වී ඇති බව පැහැදිලි වේ. එසේ වුවත් වසර එත හමාරක කාලයක් පවුලකට රුපියල් 2000 බැගින් ජීවන වියදමක් ද, සපයා දී තිබේ. වර්තමානයේ එය ද, ජනතාවට නොලැබේ. මෙමගින් පැහැදිලි වන්නේ උමා ඔය බහු කාර්ය ව්‍යාපෘතිය හේතුවෙන් රැකියාවට මෙන් ම ප්‍රතිචාරින්ගේ ආදායම් තත්ත්වයට ද, අහිතකර බලපෑමක් සිදු වි ඇති බවයි.  එනිසා ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි මෙම ව්‍යාපෘතිය මඟින් අහිතකර බලපෑමක් සිදු වී තිබෙන බව අනිවරණය කර ගත හැකිය.

**උමා ඔය ව්‍යාපෘතිය මඟින් ප්‍රතිචාරින්ගේ යටිතල පහසුකම් කෙරෙහි බලපා ඇති ආකාරය.**

සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් මිනිස් අයිතිවාසිකම් කෙරෙහි හිතකර බලපෑමක් මෙන්ම අහිතකර බලපෑමක් සිදුකරන අංශයක් ලෙස යටිතල පහසුකම් හඳුනාගත හැකිය. මෙම සමීක්ෂණය මඟින්

ප්‍රතිචාරින්ගේ ජල, සෞඛ්‍ය, අධ්‍යාපනය, විදුලිය හා ප්‍රවාහන පහසුකම් සඳහා සිදු වී ඇති බලපෑම පහත පරිදි විශ්ලේෂණය කළ හැකිය.


ප්‍රස්තාර අංක 4: ජල පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය,2016

ප්‍රස්තාර අංක 4 තුළින් දක්වෙන්නේ නව පදිංචිය යටතේ ජලපහසුකම් ලැබීම් පිළිබඳව ප්‍රතිචාරින් මුහුණ දී ඇති තත්ත්වය පිළිබඳවයි. මෙහිදි 69% ප්‍රමාණයක් පානීය ජලය ප්‍රමාණවත් බව දක්වා ඇති අතර 12%ක ප්‍රතිශතයක් පානීය ජලය ප්‍රමාණවත් නොවන බව දක්වා තිබේ. එසේම වගාවන් සඳහා පවතින ජල පහසුකම් ප්‍රමාණවත් නොවන බව ප්‍රතිචාරින්ගෙන් බහුතරයක් දක්වා ඇති අතර එහි ප්‍රතිශතය වන්නේ 88% කි. වගාවන් සඳහා ජලය ප්‍රමාණවත් යැයි දක්වා ඇති ප්‍රතිචාරින්ගේ අදහස වුයේ වගාවක් කියලා නිවස අවට වවාගන්නා එළවලු සඳහා නල ජලයම යොදා ගන්නා බවයි. මෙහිදි මුල් පදිංචියේ දී ප්‍රතිචාරින්ට පැවති ජල පහසුකම් පිළිබඳව විමසීමේ දී සියලු දෙනාගේම ප්‍රතිචාරය වුයේ පානීය ජලය හා වගාවන් සඳහා ජලය ප්‍රමාණවත් බවයි. එහිදි ඔවුන්ගේ අදහස වූයේ "දැන් වතුර බොන්න තිබ්බට ඒවා ගන්නේ අපි සල්ලි වලට. කලින් අපි කවදාවත් වතුර සල්ලිවලට ගත්තේ නෑ. ළිං උල්පත්වලින් වතුර ගත්තා. ඔයයි ඇළයි නිසා වගාවටත් හොඳට වතුර තිබ්බා" යනුවෙනි. එවැනි පසුබිමක ජීවිකාව ගත කළ මෙම ජනතාවට පානිය ජල පහසුකම් සපයා ගැනීමට සිදු වී තිබෙන්නේ නල ජලය හරහා වීම ඔවුට පවතින ගැටලුවකි. වියළි කාලයේ දී බවුසර්වලින් ජලය සැපයීම ද මෙම ප්‍රදේශවල සිදුකර තිබේ. මුල් පදිංචියට සාපේක්ෂව ප්‍රතිචාරින්ට ජල අර්බුධයක් ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වී තිබෙන බව මින් පැහැදිලි වේ.


ප්‍රස්තාර අංක 5: සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිචාරින්ගේ සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් එතරම් බලපෑමක් සිදු වී නොමැති බව ඉහත සඳහන් 5 ප්‍රස්තාරය මගින් පැහැදිලි වේ. සෞඛ්‍ය සම්බන්ධයෙන් ඉතා ප්‍රබල බලපෑමක් හෝ ප්‍රබල බලපෑමක් සිදු වේ යැයි ප්‍රතිචාරින්ගෙන් කිසිවෙකු ප්‍රකාශ කර නොතිබෙන අතර මධ්‍යස්ථ අදසක් ප්‍රකාශකර තිබෙන්නේ 18%කි. එහෙත් සමස්ථයක් වශයෙන් සලකා බැලීමේ දි බලපෑමක් නොමැති බවට අදහස් කර ඇති ප්‍රතිශතය 82% ක් ලෙස දක්වේ. නැවත පදිංචි කිරීම් සිදුකර තිබෙන ප්‍රදේශවල සිට වෛද්‍ය පහසුකම් සපයා ගැනීමට බලපෑමක් නොමැති බව මින් පහැදිලිව හඳුනාගත හැකිය.


ප්‍රස්තාර අංක 6: අධ්‍යාපන පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගේ අදහස් විමසා බැලීමේ දී ව්‍යාපෘතිය හේතුවෙන් අධ්‍යාපනයට ඉතා ප්‍රබල බලපෑමක් සිදු වේ යැයි කිසිවෙකු ප්‍රකාශ කර නොමැති අතර ප්‍රබල බලපෑමක් වේ යැයි ප්‍රතිචාරීන්ගෙන් 18%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කරයි. මෙම පවුල්වල පාසල් යන ළමුන්ට පාසලට යාමට පැවති දුර හා නැවත පදිංචි කිරීම සමග පවතින දුර වෙනස් වීමක් සිදු වී තිබේ. මිරහවත්ත ප්‍රදේශයේ පදිංචි බහුතරයක් මෙමගින් බලපෑමට පත් වී තිබේ. බහුතර ළමුන් ප්‍රමාණයක් වැලිමඩ ජාතික ජාසලෙන් අධ්‍යාපනය ලබන අතර නැවත පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර වෙනස් වීමක් සිදු වී තිබේ. එක් මවක් ප්‍රකාශකර සිටියේ ඇයගේ දියණිය මුල් පදංචියේ දී තනියම බස් රථයෙන් පාසල් ගිය බවත් නව පදිංචියේ දී ඇති දුර හේතුවෙන් ඇය පාසලට ගෙන යාමටත් යලි පාසල ඇරුණු පසු ගෙන ඒමට යාමටත් සිදුවන බවයි. ඇතැම් ළමුන්ට පාසල් සේවා බස්රථවලට දැමීමට සිදු වි තිබේ. නමුත් බෙහෝ පිරිසකට මේ වනවිට එවැනි තත්ත්වයක් සඳහාවන මූල්‍යමය පහසුකම් නොමැති බව ද පැවසීය. මෙමගින් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකම් කෙරෙහි අහිතකර බලපෑමක් සිදු වී තිබෙන බව පැහැදිලිය.


ප්‍රස්තාර අංක 7: විදුලිය පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ට සිදු වි ඇති බලපෑම.



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

උමා ඔය ව්‍යාපෘතිය යටතේ ප්‍රතිචාරින්ට විදුලිය බලය සපයා ගැනීමේ දි ගැටලුවත් සිදු වී නොමැති බව මෙමඟින් පැහැදිලිව පෙන්වා දිය හැකිය. මෙම ප්‍රස්තාරයට අනුව පැහැදිලි වන්නේ ප්‍රතිචාරීන්ගෙන් 78% ප්‍රතිශතයක් විදුලිය පහසුකම් කෙරෙහි ව්‍යාපෘතියෙන් කිසිදු බලපෑමක් සිදුවී නොමැති බව දක්වා තිබේ. සමස්ථයක් ලෙ සලකා බැලීමේ දී විදුලිය පහසුකම් කෙරෙහි අහිතකර බලපෑමක් ජනතාවට සිදු වී නොමැති බව පෙන්වාදිය හැකිය.

ප්‍රස්තාර අංක 8: ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ට සිදුවී ඇති බලපෑම.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016


ප්‍රස්තාරයට අනුව පෙනි යන්නේ ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් ජන ජීවිතයට එතරම් බලපැමක් සිදු වී නොමැති බවයි. නැවත පදිංචි කිරීම් සිදු කර තිබෙනුයේ ප්‍රධාන මාර්ගයට තරමක් සම්බන්ධයෙන් වීම මීට ප්‍රධානම හේතුව වී තිබේ. වැලිමඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් තොරතුරු ලබා ගැනීමේ දී, එක් නිලධාරිනියකගේ අදහස වුයේ මුල් ගම්මානවල දී තිබුණු මාර්ග පහසුකම්වලට සාපේක්ෂව නව ගම්මානවල ජනතාවට මාර්ග පහසුකම් පවතින බවත් ඇතැම් මුල් ගම්මානවල සංගණනයට යාමට සිදු වුයේ මඩ ගෙහොරු උඩින් බවයි. ඒ අනුව නව ගම්මානවල ප්‍රවාහන පහසුකම් තරමක් දියුණු මට්ටමක පවතින බව ප්‍රතිචාරින්ගෙන් බහුතර පිරිසක් ප්‍රවාහන පහසුකම් කෙරෙහි බලපෑමක් නොමැති බවට ඉදිරිපත්කර තිබෙන අදහස් මඟින් මනාව පැහැදිලි වේ.

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජනතාවගේ යටිතල පහසුකම් සම්බන්ධයෙන් විමසා බැලීමේ දී ප්‍රතිචාරින් විසින් ප්‍රකාශකර ඇති ආකාරයට ජල පහසුකම් සම්බන්ධයෙන් විශාල බලපෑමක් සිදු වී තිබෙන ආකාරය හඳුනාගත හැක් අතර එමගින් ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි අහිතකර බලපෑමක් සිදු වී තිබේ. එසේ වුව ද අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහානය හා විදුලිය සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් සිදු වී නැති බව පැහැදිලි වේ. ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි හිතකර බලපෑමක් මෙන් ම අහිතකර බලපෑමක් ද, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වී තිබෙන බව ප්‍රතිචාරින්ගේ අදහස් අනුව පැහැදිලි වේ.

### පාරිසරික වශයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම.

නැවත පදිංචි කිරිමත් සමඟ පාරිසරික වශයෙන් ප්‍රතිචාරින් ගැටලුවකට මුහුණ දී තිබේද යන්න විමසා බැලීමේ දී එය පහත ප්‍රස්තාර ඔස්සේ පැහැදිපිව හඳුනාගත හැකිය.

ප්‍රස්තාර අංක 8: පාරිසරික වශයෙන් ප්‍රතිචාරින්ට සිදුවන බලපෑම.





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය,2016

මෙම ප්‍රස්තාරය මගින් පැහැදිලි වන්නේ ප්‍රතිචාරින් විසින් පරිසරයට උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වී ඇති බලපෑම පිළිබඳව වු ආකල්පයයි. ප්‍රතිචාරින්ගෙන් වැඩිම පිරිසක් දක්වා තිබෙන්නේ පරිසරයට සිදු වී ඇති බලපෑම සම්බන්ධයෙන් මධ්‍යස්ථ ආකල්පයක් පවතින බවයි. එහි ප්‍රතිශතය 45% කි. ඉතා ප්‍රබල බලපෑමක් පාරිසරික වශයෙන් පවතින බව එක් ප්‍රතිචාරියෙකු විසින් ද, ප්‍රබල බලපෑමක් පවති යනුවෙන් ප්‍රතිචාරින් 14 දෙනෙකු විසින් ද, ප්‍රකාශ කර තිබේ. එය සමස්ථ ප්‍රතිශතයෙන් 15%කි. එතරම් බලපෑමක් නැත යනුවෙන් ප්‍රතිචාරින් 21 දෙනෙකු හා කිසිසේත් බලපෑමක් නැත යනුවෙන් 19 දෙනෙකුගේ අදහස වී තිබේ. මෙහිදි බලපෑමක් තිබේ යැයි පැවසු ප්‍රතිචාරින්ගේ මතය වුයේ මුල් පදිංචියේ පරිසරයට සාපේක්ෂව නව පදිංචියේ පරිසරය කර්කශ බවයි. හේතුව වන්නෙ; ගහක්වත් මෙම ප්‍රදේශයේ නොවීමයි. එබැවින් දැඩි හිරු රශ්මියක් පවතින බව ද, දක්වා සිටියේය. මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාව පාරිසරික වශයෙන් ද, ගැටලුවලට මුහුණ දෙන බව පැහැදිලි වේ. මධ්‍යස්ථ අදහසක් ප්‍රතිචාරින්ගෙන් බහුතරයක් ඉදිරිපත් කිරීමෙන් පෙනී යන්නේ ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවට හොඳ නරක දෙකම අත් විදීමට සිදු වී ඇති බවයි.

**උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සමාජීය වශයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම.**

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සමාජීය වශයෙන් ප්‍රතිචාරින්ට සිදු වී ඇති බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ප්‍රතිචාරින්ගේ සමාජ සම්බන්ධතා කෙරෙහි සිදු වී ඇති බලපෑම හා ප්‍රතිචාරින්ගේ ඥාති සම්බන්ධතා කෙරෙහි සිදු වී ඇති බලපෑම පිළිබඳව මෙමඟින් අවධානය යොමු කරනු ලැබේ. පළමුවෙන්ම සමාජ සම්බන්ධතා කෙරෙහි සිදු වී ඇති බලපෑම විශ්ලේෂණය කිරීමේ දී මුල් පදිංචියේ සමාජ සම්බන්ධතාවල ස්වභාවයත් හා නව පදිංචියේ සමාජ සම්බන්ධතාවල ස්වභාවය පිළිබඳව විමසා බලනු ලැබේ. පහත ප්‍රස්ථාරය මඟින් ප්‍රතිචාරින්ගේ සමාජ සම්බන්ධතාවල ස්වභාවය හඳුනාගත හැකිය.

ප්‍රස්තාර අංක 9ඃ ප්‍රතිචාරින්ගේ සමාජ සම්බන්ධතාවලට සිදු වී ඇති බලපෑම.





මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

ප්‍රස්තාරයට අනුව ප්‍රතිචාරින්ගේ සමාජ සම්බන්ධතාවල ස්වභාවය විමසීමේ දි මුල් පදිංචියේ දී හා නව පදිංචියේ දී සමාජ සම්බන්ධතාවල ස්වභාවය දක්වෙන අතර එමඟින් මුල් පදිංචියේ දී සමාජ සම්බන්ධතා සාර්ථක ආකාරයෙන් පැවති බව පැහැදිලි වේ. මුල් පදිංචියේ දී සමාජ සම්බන්තාවල ස්වභාවය විමසිමේ දි අවමංගල්‍යාධාර සමිති, මහිලා සමිති, සමුපාකාර සමිති, සමුපාකාර සමිති, කෘෂි සංවිධාන හා වෙනත් ආදි සංවිධාන රාශියක් පැවත තිබේ. වෙනත් සංවිධාන වශයෙන් දැක්වීමේ දී වැඩිහිටි සංවිධාන ප්‍රමුඛ ස්ථානයක් ගනී. ප්‍රතිචාරින්ගෙන් 94%ක් අවමංගල්‍යාධාර සමිතිවලත්, 88%ක් මහිලා සමිත්වලත්, 73%ක් කෘෂි සංවිධානවලත්, 61%ක් සමුපාකාර සමිතිවලත් සමාජිකත්වය ලබා තිබේ. නමුත් නව පදිංචියත් සමඟ මෙම සංවිධානවල සාමාජිකත්වය වෙනස් වීමකට ලක් වී ඇති බව ඉහත ප්‍රස්තාරයට අනුව හඳුනාගත හැකිය. එමගින් පැහැදිලි වන්නේ, අවමංගල්‍යාධාර සමිති හා මහිලා සමිති සුපුරුදු පරිදි ක්‍රියාත්මක කරගෙන යාමට නව ගම්මානවලදී ද, ප්‍රතිචාරින් කටයුතු කර ඇති බවයි. කෘෂි සංවිධාන පිළිබඳව සලකා බැලීමේ දී පෙනී යන්නේ, වගා බිම් අහිමි වීමත් සමඟ කෘෂි කර්මාන්තය අඩාල වී ඇති පසුබිමක් තුළ කෘෂි සංවිධාන ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමක් නොපවතින බවයි. නමුත් සංවිධානයක් වශයෙන් කෘෂි සංවිධාන අහෝසි කර නොමැති අතර ක්‍රියාත්මක භාවයෙන් මේ වනවිට ඉවත් වීමක් දක්නට ලැබෙන බවයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබෙන්නේ සාමකාමීව රැස්වීමටත්, සමාගමයේ නිදහසටත්, වෘත්තිය සමිති පිහිටු වීමේ හා වෘත්තිය සමිතිවලට බැඳීමේ නිදහසත් ජනතාවට පවති යනුවෙනි (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, 1978). නමුත් නව පදිංචියත් සමඟ ප්‍රතිචාරින්ගේ මෙම අයිතියට බාධාවක් පැමිණ ඇති බව මෙමගින් පැහැදිලිව හඳුනාගත හැකිය. එය පැහැදිලිව හඳුනාගත හැකි වන්නේ ගොවි සංවිධාන ක්‍රියාත්මක භාවයෙන් ඈත් වීමෙන් සහ වෙනත් සංවිධාන යටතේ මුල් පදිංචියේ දී හඳුනාගනු ලැබූ වැඩිහිටි සමිති ද, ක්‍රියාත්මක භාවයෙන් ඈත් වී තිබීමෙනි. සමාජ සම්බන්ධතාවයන් පිළිබඳව විමසීමේ දී ප්‍රතිචාරින්ගේ සමාජ සම්බන්ධතා ඉහළ මට්ටමක පැවති බවත් නව පදිංචියත් සමඟ සමාජ සම්බන්ධතා යම් ආකාරයක බබලපෑමට ලක් වී ඇති බවත් ඉහත සඳහන් ප්‍රස්තාරය මඟින් පැහැදිලිව පෙන්වාදිය හැකිය. මීට අමතරව සමාජීය බලපෑම පිළිබඳව විමසීමේ දී ඥාති සම්බන්ධතා කෙරෙහි ඇති වී තිබෙන බලපෑම පිළිබඳව ද, විමසීම වැදගත්වන අතර එය පහත ප්‍රස්තාරය මඟින් පෙන්වා දිය හැකිය.

ප්‍රස්තාර අංක 10ඃ ප්‍රතිචාරින්ගේ ඥාති සම්බන්ධතා කෙරෙහි සිදු වී ඇති බලපෑම.




මූලාශ්‍රය ඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

ඥාති සම්බන්ධතා කෙරෙහි කුමන ආකාරයේ බලපෑමක් උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වී තිබේ ද, යන්න විමසීමේ දි ඥාති සම්බන්ධතා කෙරෙහි බලපෑමක් ඇත යනුවෙන් ප්‍රතිචාරින්ගෙන් 52%ක් දක්වා තිබේ. එහිදි ඔවුන්ගෙන් බහුතරයකගේ අදහස වුයේ මුල් ගම්මානයේ දී මව්පියන්, සහෝදර සහෝදරියන් හා ඥාතීන් සමීප වශයෙන් ජීවත් වු බවත් නව පදිංචියත් සමඟ ගම් දෙකක ජීවත් වීමටත් සිදු වී ඇති බවයි. ඊට අමතරව පුහුල්පොල ප්‍රදේශයෙන් කොටසක් පමණක් නැවත පදිංචි කර ඇති බැවින් එම මුල් ගම්මානයේ දී පැවති සම්බන්ධතා තරමක් දුරස් වීමක් සිදු වී තිබෙන බව දක්වන ලදි. ප්‍රතිචාරියෙකු දක්වා තිබුනේ මුල් ගම්මානයේ දී පවුලේ සියලු දෙනාම ළඟ ළඟ නිවාස ඉදිකරගෙන පදිංචි වී සිටි බවත් නැවත පදිංචි කිරීමත් සමඟ තම පවුල හා පුතෙකුගේ නිවසක් පමණක් නව පදිංචි ස්ථානයේ ජීවත්වන අතර අනෙකුත් ඥාතීන් සියලු දෙනාම පාහේ ජීවත් වන්නේ මිරහවත්ත ප්‍රදේශයේය. මෙම ගැටලුව මුලික වශයෙන්ම ඇති වී තිබෙන්නේ මුල් ගම්මානය ලෙස පුහුල්පොල ගමේ ජීවත් වුවන්ට වන අතර එයට හේතුව වී තිබෙන්නේ නැවත පදංචි කිරීමේ දී ගම්මාන දෙකක පදිංචි කරවීමයි. කැටකැල්ල හා මිරහවත්ත එම නැවත පදිංචි කිරීම් සිදු කරන ලද ගම්මාන වේ. නමුත් මොරගොල්ල නව ගම්මානයේ ජනතාවට මෙම ගැටලුව එතරම් බලපා නැත.

ඊට අමතරව ඥාති සම්බන්ධතා පවත්වාගෙන යාමේ දී කැටකැල්ල ප්‍රදේශයේ ජනතාව මුහුණ දී තිබෙන තවත් ගැටලුවක් වේ. එනම් නව පදිංචි ප්‍රදේශයේ මුල සිටම පදිංචි පිරිසක් ජීවත් වේ. එම කොටස කැටකැල්ල වත්ත ලෙස ද, හඳුන්වන අතර එහි ජීවත් වන්නේ බහුතරයක් ද්‍රවිඩ ජනතාවය. ප්‍රතිචාරින්ගේ ආකල්පයට අනුව ඔවුන් ද්‍රවිඩ ජාතිකයන් සමඟ මුහු වීමට කැමැත්තක් නොදක්වයි. කෙසේ ද, යත් ඔවුන් පවසන්නේ ග්‍රාම නිලධාරි වසම ලෙස තමන් කැටකැල්ල ලෙස පිළිනොගන්නා බවත් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ඉල්ලීම් කර තිබෙන්නේ තමන්ගේ ග්‍රාම නිලධාරි වසම ලෙස මුල් පදිංචියේ ග්‍රාම නිලධාරි වසමම (පුහුල්පොල) ලබා දෙන ලෙසයි. වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ද එම ඉල්ලීම පිළිගෙන ඒ සඳහා මේ වනවිටත් කටයුතු යොදමින් පවතින බව දක්වා සිටියේය. ලබන වසර වනවිට එම කටයුතු අවසන්වන බව වැඩිදුරටත් ප්‍රාදේශීය ලේකම් තුමිය විසින් පවසා සිටියේය. මෙමගින් ද, ඥාති සම්බන්ධතාවලට හා සමාජ සම්බන්ධතාවයන්ට බලපෑමක් ඇති වී තිබේ. උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සමාජ සම්බන්ධතාවන් හා ඥාති සම්බන්ධතා කෙරෙහි අහිතකර බලපෑමක් සිදු වී තිබෙන බව මින් හඳුනා ගත හැකිය. එමගින් මිනිස් අයිතිවාසිකම් කෙරෙහි ද, අහිතකර බලපෑමක් සිදු වී තිබෙන බව මින් පැහැදිලි වේ.

## ප්‍රතිචාරින්ගේ ආකල්පය අනුව උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වු ගැටලුවලට වගකිව යුතු පාර්ශවයන්.


උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරින් ගැටලු රැසකට මුහුණ දී ඇති බව ඉහත සඳහන් දත්ත මගින් පැහැදිලි වේ. එහිදි ප්‍රතිචාරින්ට අනුව ඔවුන්ට ඇති වී තිබෙන ගැටලු සම්බන්ධයෙන්

වගකිව යුතු පාර්ශවයන් ලෙස දක්වා ඇත්තේ පැවති රජය, උමා ඔය ව්‍යාපෘතියේ අධ්‍යක්ෂතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා හා වර්තමාන රජය වගකිව යුතු යැයි ප්‍රතිචාරින් දක්වා තිබේ. මෙහිදි ප්‍රතිචාරින්ගෙන් බහුතර පිරිසක් එනම් 35% ක ප්‍රතිශතයක් පැවති රජය වගකිව යුතු බවත්, ප්‍රතිචාරින්ගෙන් 29% ක් උමා ඔය ව්‍යාපෘතියේ අධ්‍යක්ෂතුමා වගකිව යුතු බවත්, ප්‍රතිචාරින්ගෙන් 24%ක් ප්‍රාදේශීය ලේකම් තුමා වගකිවයුතු බවත් හා මේ සියලු දෙනාම වගකිව යුතු බවට ප්‍රතිචාරින්ගෙන් 12% ප්‍රකාශකර තිබේ. මේ අනුව පැහැදිලි වන්නේ, ප්‍රතිචාරින් විසින් තමන්ට සිදු වු ගැටලු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් පිළිබඳව විවිධ පාර්ශව වගකීම භාරගත යුතු යැයි ඉහත සඳහන් පරිදි ප්‍රකාශ කරනු ලබයි.

### ගැටලුවලට ලබා දුන් විසඳුම් පිළිබඳව ප්‍රතිචාරින්ගේ ආකල්පය.

අවසාන වශයෙන් උමා ඔය ව්‍යාපෘතිය තුළින් ඉහත සඳහන් ආකාරයට ගැටලුවකාරි තත්ත්වයක් ඇති වී තිබෙන බව මනාව පැහැදිලි වන අතර මෙමඟින් ඇති වු ගැටලු විසඳීමට වගකිව යුතු පාර්ශවයන් විසින් කටයුතුකර තිබේ. එවැනි විසඳුම් සඳහා ප්‍රතිචාරින් සෑහිමකට පත්වන්නේ ද යන්න පහත ප්‍රස්තාරය මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 11: ගැටලුවලට ලබා දුන් විසදුම් පිළිබඳ ප්‍රතිචාරින්ගේ ආකල්පය.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වු ගැටලු සම්බන්ධයෙන් ලබා දුන් විසඳුම් සම්බන්ධයෙන් ප්‍රතිචාරිනගෙන් බහුතර ප්‍රතිශතයක් ලබා දුන් විසදුම් කෙරෙහි සෑහීමකට පත්නොවන බව දක්වා තිබේ. මධ්‍යස්ථ අදහසක් දක්වා තිබෙන්නේ ප්‍රතිචාරින්ගෙන් 39% ප්‍රතිශතයකි. ලබා දුන් විසඳුම් සම්බන්ධයෙන් සෑහීමකට පත්වන කිසිදු ප්‍රතිචාරියෙකු නොවීය. එමඟින් පැහැදිලි වන්නේ උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගැටලු රාශියක් ඇති වී තිබෙන බවත් හා එම ගැටලු සම්බන්ධයෙන් ලබා දුන් විසඳුම් කෙරෙහි කිසිදු ප්‍රතිචාරියෙකු සෑහිමකට පත් නොවන බවත්ය. ඔවුන් විසින් අපේක්ෂා කරනු ලබන විසඳුම් ලෙස දක්වන්නේ සාධාරණ වන්දි මුදලක් ලබා දෙන ලෙසත්, හැකි ඉක්මනින් වගාවන් සඳහා යෝග්‍ය කුඹුරු ඉඩම් ලබා දෙන ලෙසත්ය. එය ජනතාවගේ ප්‍රධානතම ඉල්ලීම් වන්නේය. වගකිව යුතු නිලධාරින්ලේ අවධානය මුලුමනින්ම ලබා දි ගැටලුවලට සාර්ථක විසඳුම් අපේක්ෂා කරමින් ජනතාව ප්‍රකාශ කර සිටින්නේ වගාව අහිමි වීම විශාලම බලපෑම බවත් වගා බිම් මේ වනවිටත් ලැබී නැති බැවින් ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බවත්ය. මෙහිදි ප්‍රතිචාරින්ගෙන් පැමිණි අදහසක් වුයේ "අපි කියන්න පුළුවන් හැම තැනටම කිව්වා. ඒත් වැඩක් නෑ. ඔයාලා ඔය පුරවන කොළ ටික ජනාධිපතිතිටවත් කමක් නෑ දෙන්න පුළුවන්නම් දෙන්න" යනුවෙනි. ජනතාවගේ අසරණ භාවය මෙමඟින් පැහැදිලි විය.

ඉහත සඳහන් පරිදි ගැටලු සම්බන්ධයෙන් ලබා දුන් විසඳුම් සම්බන්ධයෙන් ජනතාව සෑහීමකට පත් නොවුවද වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පවතින අංශය භාර නිලධාරිනිය විසින් ප්‍රකාශකර සිටියේ ජනතාව එසේ පැවසුවත් ඔයිල ඇලේ

ජලය යටතේ වගා කරනු ලබු ඉඩම් එම ඇළ ව්‍යාපෘතිය යටතේ හානි වීමත් එය ප්‍රතිසංස්කරණය කිරීමටත් සිදු වු කාලය තුළ වගා හානි වීමට අදාළ වන්දි මුදල් ජනතාවට ලබා දුන් බවත්, වැසිකිලි ආධාර, ප්‍රවාහන දීමනා, වැඩිහිටි හා අබාධිත දීමනා හා ජීවන දීමනා අදාළ සියලු පුද්ගලයන්ට ලබා දී ඇති බවයි. මෙමඟින් පැහැදිලි වන්නේ ගැටලු විසඳීමට යම් යම් ක්‍රියා මාර්ග ගෙන තිබුණත් ප්‍රතිචාරින් ඒ සම්බන්ධයෙන් එතරම් සෑහිමකට පත් නොවන බවයි.

## නිගමනය

ඉහත සඳහන් ආකාරයට ක්ෂේත්‍ර සමීක්ෂණය මගින් ලබාගත් දත්ත අනුව මෙම විශ්ලේෂණය සිදුකරනු ලැබු අතර මෙමඟින් උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් හිතකර බලපෑම් මෙන් ම අහිතකර බලපෑම් ද ඇතිව ඇති බව හඳුනාගත හැකිය. එම බලපෑම් හේතුවෙන් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ද හිතකර බලපෑමක් මෙන්ම අහිතකර බලපෑමක් සිදු වේ. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ධනාත්මක බලපෑම් මෙන්ම සෘණාත්මක බලපෑම් සිදු වීම සාමාන්‍යයෙන් සිදු වේ. එමඟින් ඇතැම් විට අයිතිවාසිකම් උල්ලංඝනය වීම් ද සිදු වේ. උමා ඔය ව්‍යාපෘතිය ආශ්‍රිතව සිදු කරන ලද මෙම සමීක්ෂණය මගින් ද පෙනි යන්නේ ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවගේ දේපළ සඳහා වන අයිතිය, ජීවත් වීමේ අයිතිය, වෘත්තියක නිරත වීමේ අයිතිය ආදි අයිතිවාසිකම් කෙරෙහි අහිතකර බලපෑමක් මෙමඟින් සිදු වී ඇති බවයි. උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රතිදාරින්ට සිදු වී ඇති අහිමි වීම්, රැකියාවට සිදු වී ඇති බලපෑම් මෙන් ම සමාජ සම්බන්ධතා හා පාරිසරික වශයෙන් ජනතාවට මුහුණ දීමට සිදු ඇති බලපෑම් මඟින් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අයිරාංගනී, එස්. කේ., 2015. *දැඩි මහජන විරෝධය හමුවේ උමා ඔය ව්‍යාපෘතිය තවකාලිකව අත් හිටුවයි, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය,* www.wsws.org [acssessed on 26 September 2016]

චාමිකර, සජීව,. 2015, *උමා ඔය ව්‍යාපෘතියෙන් ඌවට කළ විනාශයට මහින්ද රාජපක්ෂ හා මධ්‍යම පරිසර අධිකාරිය වගකිව යුතුයි, පරිසර සංක්ෂණ භාරය.* www.vikalp.org [accessed on 26 September 2016]

මධ්‍යම පරිසර අධිකාරිය, 2010, පරිසර බලපෑම් ඇගයීමේ වාර්තාව, කොළඹ: මධ්‍යම පරිසර අධිකාරිය.

විද්‍යාරත්න, එස්,. 2015. *රටේ හදවත මධ්‍යම කඳුකරය සුරකිමු*, උමා ඔය සුරැකීමේ ජනතා ව්‍යාපාරය, බදුල්ල.

වැලිමඩ ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2015. *සම්පත් පැතිකඩ*, වැලිමඩ: වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

1978 දෙවන ජන රජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.